# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1659/9 – 2010 ජුනි 22 වැනි අඟහරුවාදා – 2010.06.22**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

### මැනුම් පනතේ 39 වගන්තිය යටතේ සකස් කරන ලද 2005 මැනුම් නියෝග සංශෝධනය කිරීම

2005 නොවැම්බර් 23 දින නිකුත් කරන ලද අංක 1420/20 දරන ගැසට් නිවේදනයෙහි ප්‍රකාර 2002 අංක 17 දරන මැනුම් පනතේ 39 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 65 වන වගන්තිය යටතේ මා විසින් අනුමත කරන ලද "2005 ඉඩම් මැනුම් (ලියාපදිංචි කිරීමේ) නියෝගයෙහි" 2(2) ඡේදයට පහත උප ඡේද ඇතුළත් කර සංශෝධනය කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත මෙයින් දැනුම් දී සිටිමි.

**ජනක බණ්ඩාර තෙන්නකෝන්,**
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

2010 ජුනි මස 11 වැනි දින,
කොළඹ දී ය.

(ඉ) එහෙත් එකී මිනින්දෝරුවරයා ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටින්නේ නම් ඔහු/ඇය ඉහත ඇ උපඡේදයේ සඳහන් ලියාපදිංචි ගාස්තු ගෙවීමෙන් නිදහස් වේ.

(ඊ) ඉහත "ඉ" උපඡේදයේ සඳහන් ලියාපදිංචි ගාස්තු ගෙවීමෙන් නිදහස් වන මිනින්දෝරුවරයෙක් තම සේවා කාලය අවසන් වීම නිසා හෝ වෛද්‍ය හේතුන් මත හෝ විශ්‍රාම යාම හැර වෙනත් ආකාරයකින් මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සේවයෙන් ඉවත්වන්නේ නම් හෝ ඉවත් කරන්නේ නම් හෝ ඉහත "ඇ" උපඡේදයේ සඳහන් මුදල මැනුම් සභාව වෙත ගෙවීමෙන් ස්වකීය සහතිකය ලබාගත යුතුය.

07 - 221


1A – G 13016 – 735 (2010/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.